## සීමාසහිත ලංකා පොස්පේට් සමාගම (රාජ්‍ය සමාගම) – 2017/2018

---

සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැකසීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන පිරිවැය රු.106,561,153 ක වත්කම් අයිතම 09ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද, ඒවායේ ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශන මඟින් ජංගම නොවන වත්කම්වල සාධාරණ අගය නිරූපනය නොවුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඇතැම් ගොඩනැගිලි, විදුලි උපකරණ සහ පිරියත සහ යන්ත්‍රවලට අදාල සමාගමේ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුව වත්කම්වල ශුද්ධ අගය ශුන්‍ය විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වත්කම්වල ශුද්ධ අගය වර්ෂය අවසානයට රු.14,198,924 ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඇතැම් ගොඩනැගිලි, විදුලි උපකරණ සහ පිරියත සහ යන්ත්‍රවල පිරිවැය ඉක්මවා රු.10,458,896 කින් ක්ෂය සඳහා වෙන් කිරීම් සිදුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ජංගම නොවන වත්කම්වල අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ අවසානයේ විවිධ වත්කම්වලට අදාල ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.917,410 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීමේදී සිදු වූ දෝෂ හේතුවෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වර්ෂයට අදාල බදු වෙන්කිරීම රු.4,100,596 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැයකරන ලද රු.346,601ක ප්‍රාග්ධන වියදම්, ප්‍රාග්ධනිත කිරීමකින් තොරව පුනරාවර්තන වියදම් ලෙස ගලපා තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වර්ෂයට අදාල ලාභය සහ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොස්පේට් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

#### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) ඉහත මතය සඳහා පදනම, විෂය පථය සහ සීමාවන්

(ආ) මා දරන්නා වූ මතය

- තත්ත්වාගණනය කළ මතය සඳහා වූ ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු හා පැහැදිලි කිරීම් මා ලබාගත් අතර, මා විසින් සිදුකරන ලද පරීක්ෂාවෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල වේ.

**2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

සී.අයි.සී. සමාගමෙන් අයවිය යුතු රු.4,569,250 ක ණයගැති ශේෂය තුළ රු.2,289,250 ක් වර්ෂ 05 ක් ඉක්මවූ ණය ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව පැවතිණි

**2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| නීති රීති,රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | |
| (අ) | මුදල් රෙගුලාසි 395 | ජංගම ගිණුමකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.25,305,645 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.10,533,931 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු35,839,576 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට නිෂ්පාදන ප්‍රමාණය හා විකුණුම් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

| | 2016/2017 | 2017/2018 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1:8 | 1:11 |
| දල ලාභ අනුපාතය සියයට | 32 | 39 |
| ශුද්ධ ලාභ අනුපාතය සියයට | (8) | 8 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පතු හා කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් ශේෂය ලෙස රු.236,738,858 ක් ජංගම වත්කම් තුළ ඇතුළත් වීම ජංගම වත්කම් අනුපාතය 1:11 ලෙස පැවතීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

(ආ) විකුණුම් හා නිෂ්පාදන ප්‍රමාණය ඉහළයාම ශුද්ධ ලාභ අනුපාතය ඉහළ යාමට බලපා තිබුණ අතර රු.19,129,460 ක් වූ නිෂ්පාදන පොදු කාර්ය වියදම් පරිපාලන වියදම්වලට ඇතුලත් වීම දල ලාභ අනුපාතය ඉහළ යාමට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය සහ සමාලෝචනය

-----------------------------------

නිෂ්පාදනය, අලෙවිය වැඩි කිරීම, නව වෙළඳපොල අවස්ථා හඳුනා ගැනීම, විදේශ විනිමය ඉතිරි කිරීම, නව පර්යේෂණ සිදු කිරීම හා උසස් සේවාවක් සැපයීම අරමුණු කර ගෙන ඇස්තමේන්තු ගත රු.මිලියන 38.9 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණ ද, ඒ අනුව කාර්යසාධන ප්‍රකාශනයක් සකස් කර ඉදිරිපත් කර තිබූ අතර මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් 10 ක් වෙනුවෙන් රු.මිලියන 20 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණද වර්ෂය තුල කිසිදු භෞතික ප්‍රගතියක් ළගාකර ගෙන නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

(අ) (i) වර්ග කිලෝමීටර් 06ක ප්‍රමාණයක පැතිර ඇති පොස්පේට් නිධිය මෙට්‍රික් ටොන් මිලියන 60ක ධාරිතාවයකින් යුක්ත බව භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ තොරතුරු අනුව අනාවරණය විය. මෙම නිධිය රටේ සංවර්ධනයට උපරිම අයුරින් යොදා ගෙන නොමැති අතර උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගැනීමට අවස්ථා කිහිපයකදී පොස්පේට් සමාගම විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර තිබුණද ප්‍රාග්ධනය සපයා ගැනීමේ ගැටලුව හේතුවෙන් එම යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(ii) සමාගම විසින් 2018 වර්ෂයේදී සීෂෝස් ෆර්ටිලයිසර් (ප්‍රයිවට්) ලිමිටඩ් ඕස්ට්‍රේලියානු සමාගම හා එක්ව පොස්පේට් නිධිය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීමක් සිදුකර වාර්ෂිකව එප්පාවල රොක් පොස්පේට් මෙට්‍රික් ටොන් 300,000 ක් ලබාගෙන සිංගල් සුපර් පොස්පේට් නිපදවීම සඳහා වූ ව්‍යාපෘතියේ මූලික කටයුතු දැනට ආරම්භකර ඇත. එසේ වුවද අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා භාණ්ඩාගාර අනුමැතිය නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(iii) රට තුල සුපිරි පොස්පේට් නිෂ්පාදනය කිරීමේ හැකියාව හා සම්පත් තිබියදී සුපර් පොස්පේට් ආනයනය කිරීම සඳහා 2018 වර්ෂයේදි ඇමරිකානු ඩොලර් 1,276,500 ක් හා අනෙකුත් කර්මාන්ත සඳහා සල්ෆියුරික් අම්ලය ආනයනය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී රු.100,701,249 ක් වැයකර තිබුණි.

(ආ) පොල් පොහොර සම්බන්ධයෙන් වූ ව්‍යාපෘති වාර්තාවට අනුව වාර්ෂිකව පොල් පොහොර ආදායම රු.මිලියන 72 ක් හා ශුද්ධ ලාභය රු.මිලියන 10 ක්ද අනෙකුත් ඍජු විකුණුම් ආදායම රු.මිලියන 12.75 ක් හා ශුද්ධ ලාභය රු.මිලියන 2.12 ක්ද, ඊට අමතරව වාර්ෂික ආදායම සියයට 10 බැගින් වර්ධනය කර ගැනීමට හා දිගුකාලීන වශයෙන් වාර්ෂිකව මෙට්‍රික්ටොන් 3000ක ප්‍රමාණයක් වෙළඳපලට ලබාදීම මඟින් සියයට 10 ක් වෙළඳපොල කොටසක් අත්පත් කර ගැනීමේ අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතියේ නිෂ්පාදන හා අලෙවි කටයුතු 2014 පෙබරවාරි 14 සිට ක්‍රියාත්මක වී තිබූ අතර ඊට අදාලව රු. 21,226,633 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණද 2015/2016 වර්ෂයේ හැර ඉතිරි සියළුම වර්ෂවල අලාභදායිත්වයක් පිළිබිඹු විය.

## 4.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එප්පාවල පරිශ්‍රයේ නව මිල් යන්ත්‍රයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී රු.11,513,434 ක් වටිනා (mill base) උපාංගයක් ඇතුළුව රු.43,453,115 ක අමතර කොටස් මිලදීගෙන තිබුණි. එහෙත් 2018 ජුලි 31 දින දක්වාම එම උපාංගය ස්ථාපිත කර නොතිබුණි. ඒ හේතුවෙන් රු.21,866,371 ක් වටිනා අමතර කොටස් තොගයක් ඉතිරිවී තිබුණු අතර වෙනත් කිසිදු කාර්යයට යොදා ගත නොහැකි රු.11,513,434 ක් වටිනා mill base උපාංගය සඳහා වාර්ෂිකව රු.2,302,678 බැගින් හානිකරණය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ආ) ලංකා පොස්පේට් සමාගම විසින් 2008 පෙබරවාරි 03 දින රු. 7,901,000 ක මුදලකට මිලදී ගත් විල්ලෝඩරයක් කැණීම් කටයුතු සඳහා භාවිතයට ගෙන යන්ත්‍ර පැය 129 වන අවස්ථාව වන විට හයිඩ්‍රොලික් පද්ධතිය බිඳ වැටී අක්‍රිය වී ඇති අතර 2015 සිට 2017 වසර දක්වා සම්පූර්ණ කාලය තුල නිෂ්කාර්යව තිබුණි. යන්ත්‍රය නිරන්තරයෙන්ම අක්‍රිය වීම් වලට ලක්වීම් හේතු කොටගෙන ඵලදායි ලෙස යොදා ගෙන නොතිබුණු යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) 2016 අගෝස්තු සිට නිෂ්පාදන කාර්යයට යොදවා තිබූ රු.34,654,178 ක් වූ ක්‍රෂර් යන්ත්‍රය භාවිතයේදී කාර්මික දෝෂ පැවතීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. ඒ අනුව 2016 අගෝස්තු සිට 2018 ජුලි දක්වා යන්ත්‍රය භාවිතයේදී නිරන්තරයෙන් කාර්මික දෝෂ හා භාවිතා කිරීමේ ගැටළු හේතුවෙන් මාස 15 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණු අතර යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි. එම කාලය තුළදී නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 9,482 ක් වැනි අඩු ප්‍රමාණයක් විය.

## 5. තිරසාර සංවර්ධනය

### තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ලංකා පොස්පේට් සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබව දැනුවත් වී තිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත් වීම මත ලංකා පොස්පේට් සමාගම විසින් සිය විෂය පථය අනුව ළඟා කර ගත යුතු අරමුණු වශයෙන් එස්එස්පී ,පොල් පොහොර,රබර් පොහොර හා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ලෙස හඳුනා ගෙන තිබුණි.

(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී ඇතැම් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟා වීමට සැලසුම් සකස් කිරීමේදී හා පෙර සූදානම් වීමේදී ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවැති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 6.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2005 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/27 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සෑම රාජ්‍ය සමාගමක්ම මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 ජූනි 21 දින දීය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | තොග පාලනය | අමු ද්‍රව්‍ය තොග වටිනාකම ගණනය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම. |
| (ආ) | මූල්‍ය පාලනය | ඉහළ වටිනාකම් පවතින ගනුදෙනුවලට අදාළව ගෙවීම් කිරීමට ප්‍රථම අභ්‍යන්තර විගණන අංශය ලවා පරීක්ෂාවන් සිදුකර නොගැනීම හා පාරිශ්‍රමික විශේෂ දීමනාව ගණනය කිරීමේදී අලෙවි ඒකක පදනම් කර නොගැනීම. |
| (ඇ) | ණයගැති පාලනය | ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර නොගැනීම හා ඒවා නිවැරදිව ගිණුම් ගත නොකිරීම. |
| (ඈ) | තොරතුරු තාක්ෂණික පද්ධතිය පාලනය | පසුගිය මාසවලට අදාළ වැටුප් තොරතුරු පද්ධතිය මඟින් ලබා ගත නොහැකි වීම හා ගැණුම් ඇණවුම් සඳහා පද්ධතිය භාවිතා නොකිරීම හා පොල් පොහොර ව්‍යාපෘතියේ ගිණුම් කටයුතු, තොගපාලනය, විකුණුම් සම්බන්ධයෙන් ස්ථාපිත පද්ධතිය විධිමත් ආකාරයකට භාවිතා නොකිරීම. |
| (ඉ) | ප්‍රසම්පාදන කටයුතු | ඇතැම් ප්‍රසම්පාදනයන් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර නොතිබීම. |